14 වන පිටෙන්




ව්‍යාපාරය අයිති කාරයකු නොමැති තත්වයට පත්ව තිබේ. දැනට මෙම ව්‍යාපාරය තුළ සක්‍රීයව සිටින්නේ ජවිපෙ හා ශ්‍රීලනිප ඇමැතිවරුන් කිහිප දෙනකු පමණකි. පසුගිය 20 දා කොළඹ නගර සභා පිටියේ පැවැත් වූ ඔහුගේ මංගල ප්‍රචාරක රැළියේ දී ඒ බව ඉතා හොඳින් පෙනෙන්නට තිබිණ. තවමත් මහින්ද රාජපක්ෂගේ මැතිවරණ ව්‍යාපාරය සිදුවන්නේ ගැමුණු කුමාරයා කිරිබත් කෑ අන්දමට තැනින්, තැනිනි. එය තවමත් ප්‍රබල අඩුවක් ලෙස නොපෙනෙන්නේ, ප්‍රතිවාදී අපේක්ෂක රනිල් වික්‍රමසිංහගේ දුර්වලකම් නිසා ය. එහෙත් ජනාධිපතිවරණයට තවත් මාස එකහමාරක පමණ කාලයක් ඇති නිසා, සංවිධානාත්මක නොවීම මහින්දට අවාසිසහගත වීමට පුළුවන.

රනිල් වික්‍රමසිංහ මහතා ජනාධිපතිවරණ සටනට බැස සිටින්නේ එජාප අපේක්ෂකයා ලෙස පමණකි. 2004 මහ මැතිවරණයේ දී ඔහු සමඟ සිටි ලංකා කම්කරු කොංග්‍රසය හා ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය පවා අද ඔහු සමඟ නැත. උතුර නැගෙනහිර ඡන්ද එල්ටීටීඊ යේ සහාය ඇතිව රනිල්ට ලබා ගැනීමට හැකි බව ඔහුගේ ආධාරකරුවන් කියා සිටින නමුත්, එල්ටීටීඊ ය හෝ ටීඑන්ඒ සංවිධානය ද මෙතෙක් කිසිවක් ප්‍රකාශ කොට නැත. අපට වැදගත් වන්නේ මැතිවරණ නොව සාකච්ඡා ආරම්භ කිරීම යැයි තමිල් සෙල්වන් මෑතක දී ප්‍රකාශ කර තිබිණි. එසේ ම මහින්ද රාජපක්ෂ පාර්ශ්වය ඒකීය රාජ්‍ය සටන් පාඨය සමඟ දකුණේ සිංහල බෞද්ධ ජනතාව ඇමැතීම නිසා රනිල්ට එල්ටීටීඊ හිතවාදී ලෙස හැසිරීමේ ඉඩකඩ අසුරා තිබේ.

රනිල්ට ආවේණික ඕලාරික බව හා රජ ලොවේ ජය නොගසා සිටීම ද ඔහුගේ අවාසියට හේතු වී තිබේ. ජනබල මෙහෙයුමේ දී රබන් ගසන්නට ගොස් අමාරුවේ වැටුණ රනිල් තමන් බලයට පැමිණි පසු 'පැරකුම් යුගයක්' ඇති කරන බව පැවසීම නිසා අසීරු තත්වයට පත්ව සිටී. පැරකුම් යුගයක් ඇති කිරීමේ සටන් පාඨයට දැඩි ලෙස තාර්කික ප්‍රති ප්‍රහාර එල්ල වෙද්දී පරක්‍රමබාහු ඉඩම් ගොඩකළ බවට ප්‍රකාශ කිරීම නිසා එම ප්‍රතිප්‍රහාර තවත් දැඩි වී තිබේ.

එක්සත් ජාතික පක්ෂය දැන් සිටින්නේ සටන් පාඨ නොමැති තත්වයකය. රනිල් වික්‍රමසිංහගේ නායකත්වය යටතේ එම පක්ෂය මැතිවරණ 13 ක් පරාජය වී තිබේ. ආණ්ඩු බලය ලබා ගත්ත ද වසර දෙකකට වැඩි කාලයක් එය පවත්වා ගැනීමට ඔශු අසමත් විය. ඔහුට ඒකීය රාජ්‍යයක් වෙනුවෙන් පෙනී සිටීමට ද නොහැක. එක්වරක් ජනාධිපතිවරණයට ඉදිරිපත් වී ඉන් පරාජය වූවෙකි. එහෙත් මහින්ද රාජපක්ෂ යනු ප්‍රථමවරට ජනාධිපතිවරණයට ඉදිරිපත් වන්නෙකි. අලුත් නායකයෙකි.

මේ නිසා, එක්සත් ජාතික පක්ෂය සිය සටන් පාඨයක් ලෙස අගමැතිවරයාගේ 'හෙල්පින් හම්බන්තොට' සිද්ධිය කරලියට ගෙන ඒමට විශාල පරිශ්‍රමයක් දරමින් සිටී. එසේ ම, පසුගිය මහ මැතිවරණයේ දී ජාතික ප්‍රශ්නය විසඳීම ප්‍රධාන කාරණාවක් කරගත් එජාපය අද එයට ප්‍රමුඛත්වයක් දී නැත. ඒ වෙනුවට අද ඔවුන්ගේ මාධ්‍ය තේමාව වී ඇත්තේ ජීවන වියදම හා ආර්ථිකයයි. දැනට සිදුකොට ඇති සමීක්ෂණ මගින් අනාවරණය වී ඇත්තේ රටේ බහුතරයක් ප්‍රමුඛතා ලැයිස්තුවේ අංක එකට ඇත්තේ ජීවන වියදම බවය.

විශේෂයෙන් ම ඔවුන් අග්‍රාමාත්‍යවරයා හා ජවිපෙ අතර ඇති වූ එකඟතාව නිසා 70-77 යුගයේ මෙය සංවෘත ආර්ථිකයක් ඇති වී පෝලිම් යුගයක් ඇතිවනු ඇතැයි යන හීතිකාවක් ඇතිකරමින් සිටී. මෙය සත්‍ය නොවුණ ද එජාපයේ තර්කයට සාර්ථක ලෙස මහින්ද රාජපක්ෂ පාර්ශ්වයෙන් මේ දක්වා පිළිතුරු ලැබී නැත.

නිසි සටන් පාඨ නොමැති වුව ද එජාප මැතිවරණ ව්‍යාපාරය කිසියම් ඉලක්කයක්, අරමුණක් සහිතව පිළිවෙළකට ක්‍රියාත්මක වන බවක් දක්නට තිබේ. විශේෂයෙන් නාගරික මැද පංතිය තුළත් සුළු ජාතිකයන් අතරත් රනිල් වික්‍රමසිංහ මහතා කෙරෙහි විශ්වාසයක් පවතින බවක් දක්නට තිබේ.

කෙසේ වුවද, බහුතරයක් ජනතාව තවමත් ජනාධිපතිවරණය සම්බන්ධයෙන් තීරණයක් ගෙන ඇති බවක් දක්නට නැත. එම තීරණය ගැනීමට තවත් කාලය තිබේ. ඒ කාලය තුළ ඔවුන් ගන්නා තීරණය අනුව දැනට පවතින තත්වය මුළුමණින් ම වෙනස් වීමට ද වුව ද අවස්ථාව ඇත. ■




13 වන පිටෙන්

වශයෙන් ම බලාපොරොත්තු වන්නේ මැද පෙළේ එසේත් නැත්නම් 90% ක් කම්කරුවන්ගේ පඩිය සතියකට ඩොලර් 125 කින් කප්පාදු කිරීමටයි. එයට අමතරව ඔස්ට්‍රේලියානු සමාජ ක්‍රමයේ සමබරතාව රැකදුන් වැටුප් සහිත ගැබිනි නිවාඩු, දීර්ඝ කාලීන රැකියාවකින් අනතුරුව ලැබෙන දිගු නිවාඩුව (Long Service Leave) සති අග සහ රාත්‍රී වැඩ මුර වෙනුවෙන් ලැබෙන අමතර වැටුප්, නිල ඇඳුම් දීමනා, උගත්කමේ නිපුනතාව වෙනුවෙන් ලැබෙන දීමනා, ඇතුලු සියල්ල විනාශ කිරීමට සූදානම් වේ. මෙයට අමතරව සියලු බඳවා ගැනීම් ගිවිසුම් මත සිදු වේ. එම ගිවිසුමට අනුව ඕනෑම අයෙකු ඕනෑම මොහොතක රැකියාවෙන් ඉවත් කිරීමට පාලකයනට අයිතිය ලැබෙයි.

මෙය ඉදිරිපත් කල හවඩ් මහතා අමුතුම තාලේ මතයක් ඉදිරිපත් කලේ ය. ජාතිකත්වය, වාර්ගිකත්වය, ලිංගිකත්වය පදනම් කරගෙන කෙනෙකු අසාධාරන ලෙස රැකියාවකින් ඉවත් කරනවා නම් ඔබට නඩු කීම සඳහා ඩොලර් 4000 ක් දෙන බවයි. ඉතින් කුමන කතා ද? මේ මුදලින් දින හතරක් නඩු කී පසු නඩුවේ ඉතිරි කොටස සඳහා අම්මාගෙන් හෝ බාප්පාගෙන් මුදල් ඉල්ලා ගන්නට කම්කරුවාට සිදුවන බව හවඩ් මහතා නොදන්නේ යයි කෙසේ සිතන්නද?

මා ඉහත සඳහන් කල ලෙස පනත ඉදිරියට ගෙන ආවේ ද හවඩ් මහතා ය. පනතට පාට ගාන්නට උත්සාහ ගන්නේද ඔහුමය. දැන් මේ විකෘති රංගනයේ නලුවන් ලෙස මැග් ලී, බානබී මෙන් විකට නලුවන් සොයා ගැනීමේ කාර්යය ඔහුගේ මාධ්‍යයට බාර දී ඇත.

අපේ විපක්ෂය දැන් වේදිකාවට පැමිණීමේ කාලය උදාවී ඇත. එසේ පැමිනිය යුත්තේ ආත්ම ශක්තිය, පෞරුෂත්වය ඇති විපක්ෂයක් ලෙස මිස විකට නලුවකු ලෙස නොවේ. කාලාන්තරයක් තිස්සේ සාධාරණ සමාජ ක්‍රමයක් ලෙස පැවති මේ සමාජ ක්‍රමය උඩු යටිකුරු කිරීම මහත් පාපයකි. පවුල සහ රැකියාව එකම දම්වැලක පුරුක් දෙකක් ලෙස ගමන් කිරීම තුලින් සියදිවි නසා ගැනීම හා පවුල් බිඳ වැටීම අවම වුනි. ඒ තුලින් අපි උදාර සමාජ ක්‍රමයක් ලෝකයට දායාද කලෙමු.

නමුත් ලාබය නමැති සාධකය ලතුලින් ගමන් ගන්නා ව්‍යාපාරිකප්‍රජාවට සියලු සමාජ සාරධර්ම විනාශ කරමින් ඉදිරියට යන්නට මහජනතාවගේ ඡන්දයෙන් බලයට පත් වූ රජයක් ඉඩ දීම ඉතාමත් වේදනාකාරී ය. අවදිවීම අපේ ජයග්‍රහනයයි. ■




